# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

## 80LBS කොන්ක්‍රීට් සිල්පර සඳහා ගැළපෙන රබර් පෑඩ් 200,000ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය

### IBF අංකය : SRS/ F.8115

01. ශ්‍රී ලංකා දුම්රිය සේවය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින්, 80LBS කොන්ක්‍රීට් සිල්පර සඳහා ගැළපෙන රබර් පෑඩ් 200,000ක් මිලදී ගැනීම සඳහා දේශීය නිෂ්පාදකයින් සහ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර ලබා ගැනීමත් ලංසු ලේඛන පරීක්ෂාකොට බැලීමත් පහත සඳහන් ලිපිනයේ දී රාජකාරී දිනවල 2025.06.09 දින සිට 2025.07.02 දින දක්වා පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර, කාලය තුළ සිදුකළ හැක.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),
දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,
ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථන අංක : 94(11)2438078 හෝ 94(11) 2436818
ෆැක්ස් අංක : 94 (11) 2432044
ඊ මේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

04. ලංසුකරුවන් විසින් මෙම අයිතමය හෝ ඒ හා සමාන ස්වභාවයේ අයිතම සැපයීමේ හැකියාව පිළිබඳ ලිඛිත සාක්ෂි සමග වෙනත් ආයතනවලට අදාළ අයිතම සැපයීම පිළිබඳ පෙර වාර්තා, කාර්ය සාධන සහතික සහිතව මිල ගණන් සමග ඉදිරිපත් කළ යුතුය.

05. ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 13,200/- ගෙවීමෙන් හා ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුවේ කාර්යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, 2025.06.09 දින සිට 2025.07.02 දින ප.ව. 3.00 දක්වා උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ සම්පූර්ණ ලංසුලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

06. සියදුම ලංසු සමග වටිනාකම රුපියල් 550,000.00 වූ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවක් විසින් නිකුත් කළ කොන්දේසි විරහිත ඇපකරයක් ලෙසට වූ ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය.

07. ලංසු පහත සඳහන් ලිපිනය වෙත, 2025.07.03 දින ප.ව. 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතු අතර, ඒ හා සමගම ලැබී ඇති ලංසු විවෘත කෙරේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටීමට අවසර ඇත. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කට් මාවත, කොළඹ 10.**

**යොමු අංකය : SRS/F. 8115**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**